# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2198/4 - 2020 ඔක්තෝබර් මස 19 වැනි සඳුදා - 2020.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ARA/LND/ACQVI/D3/48.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ අංකය* : 4-3/15/2017/VE/317.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශතාවේ විස්තර* :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 33, තල්ගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තල්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2019.06.24 දිනැතිව පිළියෙල කරන ලද අංක මු. පි. කැ. 3689 දරන මූලික පිඹුරේ කැබලි අංක 01, 02 හා 03 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.4867 පමණ වූ ගම්මලේවත්ත, එගොඩකපුවෙල්ලේහේන, ගුරු බැවිල සහ අඹගැටේහේන නමැති ඉඩම් සඳහා මායිම්:

**කැබලි අංක 1**

ඉඩමේ නම: ගම්මලේවත්ත, එගොඩකපුවෙල්ලේහේන, ගුරුබැවිල සහ අඹගැටේහේන; ප්‍රමාණය: හෙක්. 3.3986

මායිම්.- *උතුරට* : ගම්මලේවත්ත, ගුරුබැවිල සහ අඹගැටේහේන සහ කුඩා ඔය; *නැගෙනහිරට* : කුඩා ඔය, ගුරුබැවිල සහ වල්කොටුව; *දකුණට* : මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම; *බටහිරට* : මළ ඇළ, 2 වැනි බිම් කැබැල්ල සහ ගම්මලේවත්ත.

*වෙනත් කරුණු*.- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා හෙම්මාතගම, බමුණාගම්මන පදිංචි යූ. ජී. සේනාරත්න, එච්. නන්දාවතී සහ පදිංචි යූ. ජී. ස්වර්ණමාලි. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

**කැබලි අංක 2**

ඉඩමේ නම: -; ප්‍රමාණය: හෙක්. 0.0216

මායිම්.- *උතුරට* : 3 වැනි බිම් කැබැල්ල, ගම්මලේවත්ත සහ මළ ඇළ; *නැගෙනහිරට* : ගම්මලේවත්ත සහ 1 වැනි බිම් කැබැල්ල; *දකුණට* : 1 වැනි බිම් කැබැල්ල, මළ ඇළ සහ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම; *බටහිරට* : මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම සහ 3 වැනි බිම් කැබැල්ල.

*වෙනත් කරුණු*.- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී.. මුල් හිමිකම් පාන්නා හෙම්මාතගම, බමුණාගම්මන පදිංචි යූ. ජී. සේනාරත්න, එච්. නන්දාවතී සහ පදිංචි යූ. ජී. ස්වර්ණමාලි. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

**කැබලි අංක 3**

ඉඩමේ නම: ගම්මලේවත්ත, එගොඩකපුවෙල්ලේහේන, ගුරුබැවිල සහ අඹගැටෙහේන; ; ප්‍රමාණය: හෙක්. 0.0665

*මායිම්.- උතුරට* : ගම්මලේවත්ත; *නැගෙනහිරට* : 2 වැනි බිම් කැබැල්ල; *දකුණට* : 2 වැනි බිම් කැබැල්ල සහ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම්; *බටහිරට* : ගම්මලේවත්ත.

*වෙනත් කරුණු.-* ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා හෙම්මාතගම, බමුණාගම්මන පදිංචි යූ. ජී. සේනාරත්න, එච්. නන්දාවතී සහ පදිංචි යූ. ජී. ස්වර්ණමාලි අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියාසිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 17 වැනි දින පෙ. ව. 10.00 ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 නොවැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඉසෙඩ් ඒ. එම්. ෆයිසල්,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2020 ඔක්තෝබර් මස 15 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
අරණායක.

10 -1155

## ශුද්ධිපත්‍රිකාව

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත
(460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : BD/BD/LND/3/5/18/813.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 1979/29 හා 2016.08.10 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ 7A පිටුවෙහි සඳහන් 2016.05.02 දිනැති හා මූලික පිඹුරු අංක අ. ග. පි. 80, අතිරේක 56, අංක 51ට අදාළ කැබලි අංක 813හි මුල් හිමිකම් පාන්නා "සොයාගත නොහැකි" යන්න, අනුරේඛන අංක B/BDL/2020/91 හා 2020.08.26 දිනැති සංශෝධිත පිඹුර අනුව "පුෂ්පරාණි පරණවිතාන" ලෙස නම ඇතුළත් විය යුතුයි.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

.
2020 සැප්තැම්බර් මස 30 වැනි දින
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බදුල්ල.

11-08

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.